# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026

## ප්‍රායෝගික පරීක්ෂණ

පහත දැක්වෙන විෂයයන් සඳහා ලිඛිත විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ දිවයින පුරා පැවැත්වීමට කටයුතු සලසා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| විෂය අංකය | විෂයය | ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන දිනයන් |
|---|---|---|
| 52 | නර්තනය (දේශීය) | 2026.09.24 – 2026.10.03 |
| 53 | නර්තනය (භරත) | |
| 54 | සංගීතය (පෙරදිග) | |
| 55 | සංගීතය (කර්ණාටක) | |
| 56 | සංගීතය (බටහිර) | |
| 57 | නාට්‍ය හා රංග කලාව (සිංහල) | |
| 58 | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | |
| 59 | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | |
| 65 | ඉංජිනේරු තාක්ෂණවේදය | 2026.09.30 – 2026.10.10 |
| 28 | ගෘහ ආර්ථික විද්‍යාව | 2026.10.10 – 2026.10.20 |
| 66 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 2026.10.17 – 2026.10.21 |

උක්ත විෂයයන්හි පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර අදාළ පාසල්වල විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර තම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට ද ප්‍රායෝගික පරීක්ෂණ ආරම්භවීමට පෙර ලැබෙන සේ තැපැල් මඟින් යැවීමට කටයුතු කරනු ඇත. ඊට අමතරව විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිසීම මඟින් අදාළ ප්‍රායෝගික පරීක්ෂණ ආරම්භ වීමට දින 07 කට පෙර සිට ප්‍රවේශපත්‍ර බාගත කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

මේ සම්බන්ධයෙන් යම්කිසි විමසීමක් ඇත්නම් ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් දුරකථන අංක ඔස්සේ ඇමතීම් කළ හැකි බව කාරුණිකව සලකන්න.

- **විමසීම**
  - ක්ෂණික දුරකථන - 1911
  - දුරකථන අංක - 0112785922, 0112784537, 0112786616, 0112784208
  - විද්‍යුත් තැපැල - gcealexam@gmail.com

ඒ.කේ.එස්.ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල
2026 සැප්තැම්බර් 16 දින